


# ඔබට උරුම මහවැලිය




බෝවතැන්න ජල විදුලි බලාගාරයට ජලය ගෙනෙන සැතපුමක උමඟ කැණීමේ කටයුතු දිවා රෑ මුළුල්ලේ කෙරේ.
රෑ වැඩ කාණ්ඩය 'ජම්බෝ' යන්ත්‍රයෙන් මහ ගල විදීමට සැරසෙයි.




මහ වැලි ජල කඳ නුවර කලාවියටත් තබන්නාවුමටත් බෙදු හරින මධ්‍යස්ථානය වන බෝවතැන්න ජලාශය වේල්ල හා අමුණ. අඹන් ගඟ හරස් කරන වේල්ල දිගින් අඩි 1048 ක් ද උසින් අඩි 98 ක් ද වේ. ජලාශය අක්කර 15,00 ක් පුරා විසිරේ. සැතපුම් 4 ක උමඟක් තුළින් ලෙන දොරට යන ජලය නුවර කලාවියටත්, ඉතිරිය අඹන්ගඟ දිගේ තබන්නාවුමටත් යවනු ලැබේ.



මහාවැලි ව්‍යාපාරයේ මුල් මෙන්ම වැදගත් පියවර වූ පොල්ගොල්ල කොන්ක්‍රීට් අමුණ.
දිග අඩි 845. උස අඩි 65 යි. අක්කර 300 ජලාශයෙන් සෑම තත්පරයකට වතුර ගැලුම් 12,500 ක් සැතපුම් 5 ක උමඟ තුළින් උකුවෙලට ගලා යයි.




බෝවතැන්න දෙවන උමං දොර.
මෙගවොට් 40 ක ජල විදුලි බලය උපදවන ජල විදුලි බලාගාරය උමං දොර ආසන්නයේ දුක් ඉදි වෙමින් පවතී.



දෑසේ කඳුලැලි පිසදූ බලනෙමි......

දහසක් වැව් බැඳි යෝධ විනිස් කැළ යළි උපදී ඇහිලක් දෙරණේ
සත්රුවන්න් නව නිදහන් වතුවී ඉහුගෙ සිනාවෙන් ඝන වැටුණේ
දූසේ කඳුලැලි පිසදූ බලනෙම් හෙට හිරු ඛළියට වසින දිගේ
ගාය නැත් ඛය නැති නිවහල් යුගයක ඉංව් ප්‍රනා රජකරනු වෙනේ
(මහගම සේකර)

නුවරකලාවියට යන මහවැලි ජලය රොක්වන්නේ රජරට මහ සයුර බඳු කලාවැවටයි. ඉතැරණි හෙළියන්ගේ විස්කම්වල සංකේතයක් වන කලාවැව සොරොවුවෙන් මහවැලි ජලකඳ පිටවේදී.



# බෝවතැන්න රටට සෙතක් ගල්නෑව අපට සෙතක්



සෝමරත්න මහතා

"බෝවතැන්න ජලාශයෙන් මුළු රජ රටටම සෙතක් වෙනවා වගේම ජලාශය නිසා අපට ගල්නෑවට එන්න වුන එක අපට වෙච්ච සෙතක්." ගල්නෑව ගොවි ගම්වල දැන් පදිංචිව සිටින බෝවතැන්න වාසීන් තම නිජබිම් අත් හැර එන්නටවීම ගැන අදහස් පල කළේ එහෙමයි.

ගල්නෑව තොරේවෙගම විජේපාල මහතා මේ විදියට බෝවතැන්නෙන් ආපු කෙනෙක් ගමේ ඉන්න කාලේ අළේට වී පස් පැලක් වැඩ කරලා. වී බුසල් 35 කට වැඩි අස්වැන්නක් කවදවත් අරන් නැහැ. පවුලේ ඉඩම අක්කර දෙකක ඉඳහිට මිරිස්, දුම්කොළ වගා කරලයි මුදලින් ආදයමක් ලබාගෙන තියෙන්නේ. යම් තම් කාලා ඇඳලා ඉන්න ඇති. කඩේකට යන්න වුනත් අපිට හැතැප්ම අටක් විතර පයින් යන්න වුනා. අපි විජේපාල මහත්මයාගේ ගෙදරට යන කොටත් එයා බෝවතැන්නට ගිහින්. පවුලේ විස්තර කිව්වෙ එයාගේ බිරිඳ සුමනාවතී මහත් මිය. දූලා තුන් දෙනෙක් ඉන්නවා.

අපිට දැන් තමන්ගෙම කියලා කුඹුරක් තියෙනවා. 76 අපි මෙහේ මුල් අස්වැන්න ගත්ත බුසල් 100 ක් විතර. අපිට ලොකු සතුටක් බෝවතැන්නේ ඉන්න කොට තරම් ජීවත් වෙන්න කරදර නැහැ. ගොවිතැන් වැඩත් පහසුයි. අපේ මී හරක් දෙබාන අපි දක්කන් ආවා මෙහාට, දවස් හතරක් තිස්සේ, අපේ එක්කෙනායි, එයාගේ මල්ලියි දෙන්නම කියන් නේ කුඹුරු වැඩට ට්‍රැක්ටර් ඕන නැහැ කියලයි. මී හරක් දෙමහන හොඳටම ඇති. ඒත් උක්ව කණ කොල කවන්න තැනක් නැති එකයි ප්‍රශ්නේ.

ගොවිතැන් වැඩ තවම පරණ පුරුදු විදිහටයි කරන්නේ. මේ ගමන ගොයමට පෝර දැම්මෙත් නැහැ. ඇයි ඒ වැඩට බැංකුවෙන් වගා ණය දෙනවනේ? ණය වෙන්න බැහැ. ඕවා පස්සේ කරදර වෙන්න පුළුවන් වැඩ. ගෙවා ගන්න බැරි වුනොත් කියලා එයා ණය ගත්තේ නැහැ වී ටිකක් විකුණලයි කුඹුරු වැඩ කළේ,

## ඉස්කෝලෙ

අනික් ප්‍රශ්නේ ඉස්කෝල. අපේ දූලා උදේ රේඩියෝ එකේ පිරිත් පටන් ගන්න කොට අඳු රේම ඉස්කෝලේ ගමන පටන් ගන්නවා. ආයේ ගෙදර එන්නේ ගොම්මන් වෙලාවේ. දවසකට හැතැප්ම දෙළහක් විතර පයින් යනවා සේනපුර ඉස්කෝලෙට. මේ කිට්ටුවක නවවන පංති තියෙන ඉස්කෝලයක් නැහැ බස් ඇත්තෙත් නැහැ. ළමයින්ට හරිම වෙහෙසයි. පොතේ පතේ වැඩක් කරන්නවක් වෙලාවක් නැහැ. සුමනාවතී මහත්මිය තවත් දුක් ගැන විල්ලක් කීවාය.

අපි මෙහාට ඇවිල්ලා මේ ඉඩමේ හද ගත්ත ගේ පිච්චුනා. හැබැයි ඉතින් ගමේ අය ඔක් කොම උදව් වෙලා මේ ගේ පොඩ්ඩ හදලා දුන්න. බෝවතැන්නෙන් ආපු ගමේ අය එක ඉසව්වක පදිංචි කරලා. එකමුතුකම් තියෙනවා ගම එහෙම පිටින්ම එකටයි. බෝවතැන්නෙන් ආපු සෝමරත්න මහතාත් මෙහිදී කතාවට හවුල් වුනා.

මේ විජේපාල මල්ලිගේ ගේ හද දුන්න වාගේ අපි දූකට සැපට දෙකටම ඉන්නවා. බෝව-තැන්නෙන් ආපු එක හොඳයි. ඉස්සර අපි ඉන්-නන් වාලේ ජීවත්වුනා. දැන් තමන්ගේ දූතේ හයියෙන් ගොවිතැනක් කරන් නිදහසේ මිනිස්සු හැටියට ජීවත් වෙන්න අපේම පොලවත්, නිව හනත් තියෙනවා. ඕනැ අපේ උනන්දුවයි උත් සාහයයි ඒත් තව වැඩ කිහිපයකට මණ්ඩලයේ සහයෝගය ඕනෑ.

බීමට වතුර ගන්න ළිං හාර ගන්න. එක එකක්. වැසිකිලි ලැලි තවමත් ලැබිලා නැහැ. මේ ලොකු ළමයින්ට ඉස්කෝලවලට හරි දුරක් යන්න ඕන. මේ සේරම එක සැරේ කරන්න බැරි බව ඇත්ත ඒත් මේවා මූලිකම අවශ්‍යතා නේද? යෝමරත්න මහත්තයා වැදගත් ප්‍රශ්න-යක් මතු කළා

අනික් එක ගොවිතැන් වැඩ. අපේ කුඹුරුවල ''කිවුල'' තියෙනවා. ගිය මහට බුසල් 150 ක් ගත්තා. අක්කර දෙකෙන්. යලට බුසල් 31 යි. මේ සැරෙත් බුසලක විතර පැල වී කිවුලට මැරිලා. යලට කිවුල වැඩියි. මහට අඩුයි. අපි අළු හුණු, ලුණු දමනවා එතකොට කිවුල අඩුයි. ඒත් උපදේශක මහත්වරු කියන්නේ ඒවා දමන්න එපා කියලා අපි තවම ගොවිතැන් කරන්නේ අපේ පරණ දැනුමෙන්. ඒ ගැන අපට ලැබෙන උපදෙසක් නැති තරම්.

බෝවතැන්නෙන් ආපු එච්. ජී. පියසේන මහතාගේ ප්‍රධාන දුක් ගැනවිල්ල වෛද්‍ය පහසු කම නැති එකයි. බස් ගමනා ගමනය දුර්වල එකයි. විශේෂයෙන් වින්නඹු සේවාවන්. ගැබිණි එවක් බයිසිකලයකින් එප්පාවල රෝහල ට ගෙන යද්දී අතරමගදී ළමයෙක් ලැබීම ඔහු නිදසුනක් හැටියට පෙන්නුවා නොයෙකුත් ප්‍රශ්න ගැන ලියපු පෙත්සම් මිටියක්ම එයා ළඟ ඒත් තවම විසඳුම් ගැන හෝඩුවාවක් නැතිලු.

මේ වාගේ මූලික අඩුපාඩුකම් තිබුණත් බෝව තැන්නෙන් ගල්නෑවට එන්න වෙච්ච එකට හැමෝම සතුටුයි. මේ අඩු පාඩුත් මහවැලි මණ්ඩලය මගින් නොපමාව සපයලා දෙනු ඇතැයි ඔවුන්ගේ බලාපොරොත්තුවයි.

# මහවැලියේ නව ඇළමං

මහවැලි සංවර්ධන සැලැස්මට ඉලක්ක දෙක කි. එනම් වැඩිවන ජනගහනයට සරිලනසේ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීම හා කර්-මාන්තවල වැඩිවන අවශ්‍යතාවන්ට සරිලන පරිදි විදුලිබල නිපැයුම වැඩි කිරීමයි.

ව්‍යාපාර ප්‍රදේශයේ පස, වාරිමාර්ග තත්වයන් වැනි නොයෙකුත් කරුණු හැදෑරීමෙන් පසු මතු දැක්වෙන අයුරින් වගා රටාවන් නිර්දේශව ඇත

1. වැඩිපුර ජලය අවශ්‍යවන වී උක්. හා තණ වර්ග මහවැලි හා මාදුරු ඔය නිම්නවල වගා කිරීම.
2. මහවැලි දකුණු ඉවුරු ඉඩම්වල එළවළු හා නවීන ජල පහසුව අවශ්‍ය සෙසු බෝග වගා කිරීම. දකුණු ඉවුරු පස ඉතා සරු වුවද, උස්සාන වාරි ක්‍රමය යටතේ ජලය සැපයීමට සිදුවෙන හෙයින් මෙම වගා නිර්දේශවී තිබේ.
3. උතුරු මැද පළාත් ඉඩම්වල කපු. මිරිස්, බඩ ඉරිඟු රටකජු, කොල්લු කඩල මුං ඇට, පරිප්පු ලූණු වැනි වැඩි වටිනාකම් බෝග වගා කිරීම

**නිම්නයේ ඇළමාර්ග;-**

මහවැලි නිම්නය හරහා දිවෙන ප්‍රධාන ඇළ මාර්ග ඉදි කිරීමද වැදගත් කාර්යයක්ව ඇත. ව්‍යාපාරයට අයත් ප්‍රධාන ඇළ මාර්ග මෙසේය. දකුණු ඉවුරු ඇළ-පැරණි මිනිපේ අමුණට පහ ළින් ඉදිවන නව අමුණින් මෙම ඇළට ජලය හරවනු ඇත ඊසාන දිගට ගමන් කරන ඇළ, බදුලු ඔය, ලොග්ගල් ඔය, හා හෙප්පොල ඔය හරහා ගලාගොස් උල්හිටිය ජලාශයට එක්වනු ඇත. ඉන්පසු මෙම ඇළ මහවැලි හා මදුරු ඔය නිම්න දිය බෙදුම් හරහා දිවෙන උමඟකට වැටී මදුරු ඔය ජලාශයට එක්වෙයි. අක්කර දෙලක්ෂයකට ජලය සැපයෙන සැතපුම් 29 දිගැති ඇළ ඉදි කිරීමට වියදම දසලක්ෂ 445 කි.

**වම් ඉවුරු ඇළ** - පැරණි මිනිපේ අමුණෙන් ඇරඹෙන මෙම ඇළ මහවැලි වම් නිම්නයේ හා මොරගහකන්ද ජලාශය යටතේ වන ඉඩම්වලට ජලය සපයනු ඇත. මෙම ඇළ නිමවීමෙන් පසු මොරගහකන්ද ජලාශය උතුරු මැද පළාත් ඇළට ජලය සැපයීමට යොදවනු ඇත හිංගහ හරහා ගොස් කවුඩුල්ල වැවට වැටෙන ඇළෙහි දිග සැතපුම් 90 කි කන්තලේ වැව පරාක්‍රම සමුද්‍රය මෙන්ම ගිරිතලේ හා මින්නේරිය ව්‍යා-පාරවලට ජලය සැපයීමට මීන් අතුරු ඇළ මං කැපෙනු ඇත වියදම දසලක්ෂ 950 කි.

**උතුරු මැද පළාත් ඇළ;** මොරගහකන්ද ජලාශයෙන් උතුරු මැද පළාතට ජලය ගෙන යන මෙම ඇළේ දිග සැතපුම් සියයකි අඹන් ගඟේ ඇළහැර අමුණෙන් ජලය හරවනු ඇත. නාච්චදූව මල්වතු ඔය ජලාශයට මේ මගින් ජලය සැපයෙනු ඇත. පැරණි ඉඩම් අක්කර 90,001 ට හා අළුත් ඉඩම් අක්කර 2 33,000 ජලය සපයන මෙම ඇළ මඟ ඉදි කිරීමට දස ලක්ෂ 1575 වැයවෙනු ඇත.

**ජලගැල්ම පාලනය**-මහවැලිය ස්වභාවික ගලායද්දී ජලගැල්මවලට ගොදුරුවුණ ගම් නියම් ගම්වලට වැටෙන වැසි ජලය කොත්මලේ හා රන්දෙනිගල ජලාශයන්හි ව්‍යාපාරය යටතේ ඉදිවන ජල විදුලි ඒකක ජලාශවල රඳවා පහත් බිම්වල ජලගැල්ම පාලනය කෙරෙනු ඇත.